# මෙහේ කකුලයි....එහේ කකුලයි....

## දෙලොවක් අතර මැදිවූ අපේ මිනිස්සු

අපේ රට බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් සේ පැවති කාලයේ සිටම ලාංකිකයන් උසස් අධ්‍යාපනය සඳහා පැමිණියේ එංගලන්තයට ය. එකල එසේ පිටරට යැමට හැකිවූයේ ධනපති පවුල්වල උදවියට පමණකි. එසේ පිටරට ගොස් අධ්‍යාපනය ලැබූ බොහෝ දෙනා ඒ කටයුතු අවසන් කර නැවත තම රටට ගොස් රජයේ සහ පුද්ගලික අංශයේ උසස් තනතුරුවල සේවය කරන්නට වූහ. බොහෝ දෙනා ගණකාධිකාරීන්, වෛද්‍යවරුන්, නීතිඥයින් සහ විනිශ්චයකාරවරුන් ආදී වශයෙන් ඉහළ ධානාන්තර දැරූහ. බටහිර අධ්‍යාපනය ලැබූ තවත් සමහරු කම්කරු සමිති නායකයින් හා දේශපාලකයින් වශයෙන්ද ජනතා වට සේවය කරන්න වූහ. අපේ දේශපාලන පොරපිටියේ එදා සිටි දැවැන්ත මල්ලවයින් බ්‍රිතාන්‍යයේ පුහුණුව ලැබූවන්යයි කීම වරදක් නොවේයයි සිතමි.

ඒ කාලයේ ඉගෙනීම සඳහා මෙහි පැමිණි කිසිවෙකු අධ්‍යාපන කටයුතු අවසන්කළාට පසු මෙහි නතර වූයේ නම් එය අතලොස්ස කට පමණක් සීමා වන්නට ඇත. එකල එංගලන්තයට පැමිණි අයට මෙහි නවතින්නට තරම් විශේෂ ආසාවක් වූයේ නැත.

හැත්තෑව දශකයේ සිට අධ්‍යාපනය සඳහා පමණක් නොව රජයේ ශිෂ්‍යත්ව මත කෙටිකාලීන වෘත්තීමය පුහුණුවීම් සඳහා ද එංගලන්තයට පැමිණීමේ භාග්‍යය සාමාන්‍ය වැසියාට ද උදාවිය. ඒ ආ අයගෙන් සමහරු ආ කාර්‍යයන් අවසන්කර යළි තම මව්රටට ගිය නමුත් බොහෝ දෙනෙක් මෙහි නතර වූහ.

අසූ ගණන් වලදී දේශපාලන පළිගැනීම් සහ ත්‍රස්තවාදය ආදී කරුණු මත සරණාගතයින් ලෙස පැමිණි අයගේ සංඛ්‍යාව අපි නොදනිමු. එය වෙනත් විෂයකි. අද දින පවතින ආගමන නීති අනුව අධ්‍යාපන කටයුතු සඳහා වුවද එංගලන්තයට පැමිණීම කණ කැස්බෑ විය සිදුරෙන් අහස බලනවා වැනි දුර්ලභ ගනයේ දෙයක් වී ඇත. කවුරුත් බලන්නේ ඉඩකඩම් විකුණා හෝ හතර වටේට ණයවී හෝ පවුල් පිටින් එංගලන්තයට පැමිණීමටයි. එසේ පැමිණි සමහර දෙනා තම බලාපොරොත්තු සුන්වීම නිසා ආපසු ගියා වුවද තවත් කිහිප දෙනෙක් ලෝකයට, සමාජයට, ණයකරුවන්ට මුහුණ දිය නොහැකි තත්වය යටතේ දිවි නසාගත් අවස්ථා ද අප අසා තිබේ.

අද මෙහි අප කතාකරන්නට උත්සාහ ගන්නේ අධ්‍යාපන කටයුතු සඳහා ටික කලකට මෙහි පැමිණ, ඉන් පසු මොනයම් අයුරකින් හෝ ස්ථිර පදිංචියද, බ්‍රිතාන්‍ය පුරවැසි-කමද ලබා දැන් මැදිවියේ සිටින ශ්‍රීලාංකිකයින් ගැනයි.

1960 සිට 1980 දක්වා එංගලන්තයට පැමිණි ශ්‍රීලාංකික යන්ගෙන් සියයට 80 ක් පමණ උසස් අධ්‍යාපනය සඳහා පැමිණි අය වෙති. ඒ අය තම අධ්‍යාපන කටයුතු කරන අතර කෙටිකාලීන රැකියාවල් ද කළේ කාමර කුලී, විද්‍යාල ගාස්තු සහ එදිනෙදා වියදම පියවා ගැන්මටය. ඒ කාලයේ අද මෙන් නැගණහිර යුරෝපීයයන් රැකියාවන් සඳහා බ්‍රිතාන්‍යයට පැමිණියේ නැත. එ නිසා අපේ අයට රැකියාවක් සොයාගැන්ම අපහසු නොවීය. ස්වභාවයෙන් ලාංකිකයන් තුළ නිතර ඇති සිනා මුහුණත්, විනීත ගුණගරුක කීකරු භාවයත් ඔවුනට රැකියාවක් සොයාගැන්මට ආධාරයක් වූ බව නිසැකය. ගමේ සිටියදී මෙන් නොව අලසකම අතැර දමා සීත සෘතුවේ දිත් දවසට පැය විසිහතර පවා සේවය කළ හැකි බව අප තරුණයෝ ඔප්පු කළහ. ඉන් අසීමිත සතුටට පත් රැකියා පාලකයෝ අධ්‍යාපන කටයුතු අවසන් කළාට පසු ඔවුනට තම ආයතනයේ පූර්ණ කාලීන රැකියා දීමට පොරොන්දු වූහ. එපමණක් නොව වැඩ කරන්නට අවශ්‍ය අවසර පත්‍රද රජයෙන් ලබා දුන්හ. එවැනි තනතුරු ලැබූ අය අද මෙහි සිටින ශ්‍රීලාංකිකයින් අතර ඉහළ ස්ථාන හිමිකරගෙන සිටිති.

උසස් පෙළේ වෛද්‍ය විශේෂඥ යින් ගණනාවක්ම බ්‍රිතාන්‍ය පුරා රෝහල්වල අදත් සේවයේ යෙදී සිටිති. අප යටත්කරගෙන සිටි සුද්දාට අද ඉංග්‍රීසි බෙහෙත් නියම කරන්නේ ශ්‍රීලාංකික දොස්තර වරුන් වීම අපට ආඩම්බරයක් නොවන්නේද? ලන්ඩනයේ ප්‍රධාන පෙළේ රෝහලක වකුගඩු බද්ධ කරන විශේෂඥයාව සිටියේ සිංහළ වෛද්‍යවරයෙකි. 80 දශකයේ කැම්ඩන් ප්‍රාන්තයේ සියළු මහා මාර්ග හා පාළම් භාරව සිටියේ සිංහළ ඉන්ජිනේරුවෙකි. බ්‍රෙන්ට් නගර සභාව තුළ කලක් අධ්‍යාපනය භාරව සිටි ප්‍රධානියා වූයේ සිංහළ කාන්තාවකි.

එදා එක් සූට්කේස් එකක් සහ සීනි සම්බල් බෝතලයක් ද රැගෙන එංගලන්තයට ආ බොහෝ ලාංකිකයෝ අද ගෙවල් දොරවල් යාන වාහන උසස් රැකියා සහ

*එකල ඉගෙනීම සඳහා පැමිණි අය ආපසු නොගොස් නැවතුනා නම් ඒ අතලොස්සක් පමණකි. එකල එංගලන්තයට පැමිණි අයට මෙහි නවතින්නට තරම් විශේෂ ආසාවක් වූයේ නැත.*


සාර්ථක වෙළඳ ව්‍යාපාර හිමිකර ගෙන සිටිති. ඔවුන්ගේ දරුවන්ද හොඳින් අධ්‍යාපනය ලැබ සිය දෙමාපියන්ටත් වඩා ඉහළ රැකියා වල නියුක්තව සිටින බව අපට නිතර අසන්නට දකින්නට ලැබේ.

සාර්ථක ආර්ථික ස්ථා වරයක සිටින ලාංකික වැඩිහිටි පරපුර අද සිටින්නේ විශ්‍රාම යන වයසට ආසන්නවය. ඔවුන්ට දැන් ඇති ප්‍රශනය නම් ඒ විශ්‍රාම කාලය කෙසේ ගතකරන්නටද යන්නයි. අවුරුද්ද දෙපැත්තේ ගෙවන්නට සමහරු සිතති. සීත කාලය ලංකා වේත් උශ්ණ සෘතුව එංගලන්තයේත් වශයෙනි. සමහරු මේ සඳහා ලංකාවේ ඉඩමක් ගෙන ගෙයක්ද සාදති. ඇතැම් කෙනෙක් හදාපු ගෙයක් ගනිති. එංගලන්තයට ඇති සියළු බැඳීම් අත්හැර උපන් රට වූ ලංකාවට යති. ඒ ජීවිතේ අවසාන කාලය නිවී සැනසිල්ලේ ගතකරන බලාපොරොත්තු වෙනි.

ආයෙමත් එංගලන්තේ පස් පාගන්නේ නැතැයි කියා යන්නට ගිය බොහෝ දෙනා මාස හයකට විතර පසු වෙම්බ්ලි මාර්කට් එකේදී හමුවෙති. "අපි ආවා" ඔවුන් කියන් නේ එපමණ ය. ආපහු එන්නට හේතුවක් කියන්නේ නැත. අපි අහන්නේත් නැත.

විශ්‍රාම ගිය බොහෝ දෙනාට ඇත්තේ මෙඩිකල් ප්‍රශ්නය. තමන්ට අවශ්‍ය බෙහෙත් හේත් හා ප්‍රතිකාර සඳහා ඔවුන්ට මතක් වෙන්නේ එංගලන්තයයි. එවිට ලංකාවේ ගෙදර කාටහෝ බලාගන්නට කියා ආපහු එති. ඇවිත් දවස් කීපයකින් ගේ බිඳ ඇති බව ආරංචි වෙයි. පෝය දවසට පූජාකරන්නට කාගේ හෝ වත්තකට රිංගා නොකියාම මල් කඩාගන්නා සමාජයක ගෙයක් පාළුවට තබා ආවොත් සුරැකේද?

හදාපු ගේ බලාගන්නටය කියා කෙනෙකු නවතා ඒම බොහෝ දෙනාගේ සිරිතය. එය සිකියුරිටි සමාගමකට දෙනවාට වඩා හොඳයයි සිතූ නිසාය. එහෙත් එසේ දීලා ආවාට පසු ඒ ගේ බලාගන්නා තැනැත්තා හෝ තැනැත්තිය තවත් ළමයි හත් අට දෙනෙක් ඉන්නා



*ආයෙමත් එංගලන්තේ පස් පාගන්නේ නැතැයි කියා ගිය බොහෝ දෙනා මාස හයකට විතර පසු වෙම්බ්ලි මාර්කට් එකේ දී හමුවෙති.*

පවුලක් ගෙදරට කැඳවා ගනී. ඉන්පසු ඒ ගෙයින් ගන්නට දෙයක් නැත. උන් යන් නේද නැත. ඉවත්කර ගන්නට නඩුපවරන් නට සිදුවේ. නඩුව ඇදි ඇදී යයි. නඩුව නිසාම එංගලන්තයේ සිට අවුරුද්දට හත් අට පාරක් ලංකාවට යන්නට සිදුවේ. කරන වියදම සහ විඳින දුක ගැන කල් පනා කරන විට මෙහේ ඉඳන් ලංකාවේ ගෙයක් හැදීමේ මෝඩකම සහ ඒ සඳහා නාස්ති වූ කාලය ගැන සිහිවී බෙල්ල කපා ගන්නට තරම් සමහරුන්ට සිතේ.

දෙමව්පියන්ගෙන් උරුම වූ ඉඩකඩම් ප්‍රයෝජනයක් නොගෙන විදෙස් ගත වීමෙන් හේතුවෙන් ඔහේ පාලුවට තිබෙන් නට හැරීම නිසා තමන්ගේ සහෝදර සහෝදරියන් හෝ නෑදෑයින් හොර ඔප්පු සාදා ඒවායේ අයිතිය පවරාගත් අවස්ථා එමටය. විශ්‍රාමික බොහෝ බ්‍රිතාන්‍ය ශ්‍රීලාං කිකයින්ට දැන් සිදුව ඇත්තේ ඒවා නිරවුල් කරගැනීමට නීතියේ පිහිට පතමින් ලංකා වේ උසාවිගාණේ රස්තියාදුවීමට පමණය. ලංකාවේ ඉඩම් නඩුවකට පටලැවීම තවත් සංසාර ගමනකට එක්වුණා වැනිය. නඩුකාරයාට කිසි හදිස්සියක් නැත. නඩුව ඉවර කරගන්නට හදිස්සිය ඇත්තේ පැමි ණිලිකාරයාටය. ඔහු දින කීපයකින් ආපසු එංගලන්තයට ආ යුතුය. නැත්නම් කලට වේලාවට බිල් මෝගේජ් ගෙවන්නේ කවුද? එසේම රෝහලේ වෛද්‍ය පරීක්ෂාවකට දිනයක් දී ඇත්නම් ඒ සඳහා නියමිත දිනයට පැමිණ ඊට මුහුණදිය යුතුය.

සමහර විටක නඩුව තීන්දු වන්නේ ඔහුට අවාසිවන අන්දමටය. මේ අවස්ථාව වන විට කොහොමත් නොසෑහෙන මුදලක් වැයවී අවසානය. ගෙය ආපසු ලැබුණත් ඊළඟට ඔහු කරන්නේ හැකි විගස ඒ ගෙය අඩුවට හෝ විකුණා දමා බැන බැන කළකිරීමෙන් යුතුව ආපහු එංගලන්තයට පැමිණීමය. බොහෝ දෙනෙක් මුහුණදී ඇති නඩුවල තත්වය එසේය.

විශ්‍රාමගැනීම යනු ජීවිතයේ සැඳෑ සමයට එළඹීමය. කොළ දළු ලියලන වසන්තයක් නැවත නොඑ. එනිසා ජීවිත යේ අවසාන කාලය තමන්ට හුරු පුරුදු හා පහසුකම් ඇති පරිසරයකට සීමාවන් නට හිත එකලසක් කරගත යුතුය. ඉදහිට ගියවිට දුටු සුන්දරත්වය දිගටම ඉන්නා විට නැතිබව සමහරුන්ට වැටහේ. ඔව්හු ආපසු එති. පැමිණ යළි යන්නට සිතති.

මනුෂ්‍යයෙකුට අවශ්‍ය වන්නේ එක වහළකි. දෙපළක නොව තුන් හතර පළක වුවද ජීවත් විය හැක්කේ තරුණ කාලයේ ය. එහෙත් වයසට යත්ම අපේ බොහෝ දෙනා මෙහේ ඉන්නවාද එහේ ඉන්නවාද යන්න තීරණයක් ගත නොහී දෙගිඩියා-වෙන් දෙපැත්තේම කකුල් තබා ගෙන ඉන්නට මහන්සි ගනිති. එය කළ හැකි දෙයක් නොවේ. ඔව්හු දෙලොවක් අතර අතරමංව කලකිරීමට පත්වෙති.

♦ **විල්ෆ්‍රඩ් පෙරේරා**

**Wilfred Perera, Slough Berks UK**

HolidayAir
A Travel Experience to Remember
The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value Deals to Colombo

| ROYAL JORDANIAN | JET AIRWAYS | ETIHAD AIRWAYS | GULF AIR | OMAN AIR | QATAR AIRWAYS | KUWAIT AIRWAYS | SriLankan |
|---|---|---|---|---|---|---|---|
| £125 +Taxes | £150 +Taxes | £166 +Taxes | £170 +Taxes | £205 +Taxes | £205 +Taxes | £230 +Taxes | £365 +Taxes |
| 23rd Mar 2012 | 30th Mar 2012 | 30st Mar 2012 | 20th Mar 2012 | 30th Mar 2012 | 29th Mar 2012 | 30th Mar 2012 | 30th Mar 2012 |

Flights to Sri Lanka on SriLankan
We will not be beaten on Price!
That's a promise!
If you find a cheaper quote from
Any agent
Any day
Any class
WE WILL DOUBLE THE DIFFERENCE!
Terms and conditions apply.
0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 7 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm
Skype us on holiday.air
facebook Holidayair Holidays
ATOL PROTECTED
IATA
MCG